ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ පුවත්පත

තැ. පෙ. අංක 04 මුල්ලේරියාව

දුරකථන/ෆැක්ස් : 2419782

විද්‍යුත් තැපැල : sltr@sysnet.lk

# නිවුන් පුවත්

කාණ්ඩ අංක 03 | මැයි 2005 | පිටු අංක 1 - 4


## කොළඹ දිස්ත්‍රික්කයේ

# නිවුන් සංගණනය අතිශයින් සාර්ථකයි!

**2004 වර්ෂයේ අවසන් භාගය තුළ කොළඹ දිස්ත්‍රික්කය පුරා සිදු කරන ලද නිවුන් සංගණනය අතිශයින් සාර්ථක වී ඇති බව ඔබට දන්වන්නේ ඉතා සතුටිනි.**

කොළඹ දිස්ත්‍රික්කයේ සිටින ග්‍රාම නිලධාරීන් හා මැතිවරණ කාර්යාලයට අනුබද්ධිත සංගණන නිලධාරීන් විසින් නිවාස 510,000 ක පමණ මෙම සංගණනය සිදු කරන ලදී. මෙහි දී සියලුම වයස්වල නිවුන් යුගල් 11,000 ක් පමණ මෙම දිස්ත්‍රික්කය තුළ පදිංචි වී සිටින බව වාර්තා වේ.

## බද්ධ නිවුන්නු

මෑත කාලයේ දී බද්ධ නිවුන්නු වෙන් කිරීම සඳහා ලොව පුරා කෙරුණු ශල්‍ය කර්ම කිහිපයක් ම හේතුවෙන් ඔවුන් වෙත ලෝකයේ විශේෂ අවධානයක් යොමු විය. පසුගිය අප්‍රේල් මාසයේ දී ලංකාවේ දී ද බද්ධ නිවුන් යුගලයක් බිහි වීම නිසා ලංකාව තුළත් බද්ධ නිවන්නු පිළිබඳව අවධානයක් යොමු විය.

ඉතා කලාතුරකින් ලොව එළිය දකින මොවුන් ඇති වන්නේ මවගේ ගර්භාෂය තුළ වැඩෙන



1811 දී සියම් දේශයේ දී (වර්තමාන තායිලන්තය) උපත ලැබ, පසුව බටහිර රටවල්වල සංචාරය කර ප්‍රසිද්ධියට පත් චැං සහ එං නම් වූ බද්ධ නිවුන් සහෝදරයන්

*ඍ්විචැනි පිටුවට*

### ඔබ සම අසම

## නිවුන් පුද්ගලයෙක් ද?

මෙය දන ගැනීම ඔබේ අයිතියකි. ජාත්‍යන්තර වශයෙන් මේ සඳහා යොදා ගැනෙන ප්‍රශ්නාවලියක් අප විසින් ලංකාවට ගැලපෙන ලෙස සකස් කර තිබේ.

එමෙන් ම නවීන ජාන තාක්ෂණයේ ඇසුරෙන් ද මෙය විමසා බැලිය හැකි ය. Baby 81 ගේ සැබෑ දෙමාපියන් කව්දැ යි සොයා ගැනීමට භාවිතා කළ වර්ගයේ පරීක්ෂණයන් මගින් මෙය සිදු කළ හැකි ය. මේ සඳහා ළඟ දී ම ඔබට නොමිළේ අවස්ථාවක් ලබා දීමට අපි බලාපොරොත්තු වෙමු.

## නිවුන් සංගණනයේ වැදගත්කම කුමක් ද?

නිවුන් දරුවන් කුස තුළ පිළිසිඳ ගැනීමේ සිට මෙලොවට බිහි වෙනතුරුත් ඔවුන් ලොකු මහත් වෙනතුරුත් ඔවුන්ට විශේෂිත වූ ගැටලු හා ප්‍රශ්න බොහොමයකට මුහුණපායි. ගර්භනී කාලයේ සිට ම නිවුන් දරුවන්ගේ මව ද ගැටලු රාශියකට මැදි වෙයි.

ගර්භනී මව්වරුන්ට උදෑසන කාලයේ දී ඇති වෙන වමනයේ (morning sickness) සිට ගර්භනී වලිප්පුව (Pre eclampsia) වැනි රෝග නිවුන් දරුවන් ඇති අම්මලාට සෑදීමට වැඩි හැකියාවක් ඇත. දරුවන් ප්‍රසූතියේ දී ද මෙම මව්වරුන්ට වැඩි අසීරුතාවයකට මුහුණ පෑමට සිදු වේ. නිවුන් දරුවන් බොහෝ විට නියමිත බරට අඩු නො මේරූ ළදරුවන් ය. ළදරු කාලයේ දී වර්ධනය සෙමින් සිදු වන මොවුන්ට විශේෂ අවධානයක් යොමු විය යුතු ය. නිවුන් දරුවන් බලා ගැනීමේ දී, මව්කිරි දීමේ දී, ස්නානය කරවීමේ දී නොයෙකුත් ගැටලු මතු වන අතර බොහෝ විට මවට මේ සඳහා උදව් අවශ්‍ය වේ.


තව ද අප ලේඛනාගාරයට ලැබී ඇති බහුතරයක් ලිපි වලින් හෙළි වනුයේ නිවුන් දරුවන් රැක බලා ගැනීමේ දී හා අධ්‍යාපනය ලබා දීමේ දී ඔවුන්ගේ දෙමාපියන්ට ආර්ථිකමය ගැටලු බොහොමයකට මුහුණ පෑමට සිදු වන බව ය. පාසල් අධ්‍යාපනය ලබා දීමේ දී නිවුන් දරුවන් එකට තබා අධ්‍යාපනය ලබා දීම ඉතා වැදගත් වන අතර, ඔවුන්ට එක ම පාසලක් ලබා ගැනීමේ දී ද අපගේ අධ්‍යාපන ක්‍රමය තුළ දී නොයෙකුත් අසීරුතාවයන් ඇති වේ. ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ නිවුන් දරුවන් සහ එම පවුල්වල ට අවශ්‍ය, විශේෂිත වූ සේවාවන් ස්ථාපනය කිරීමට රාජ්‍ය ප්‍රතිපත්ති සැලසුම්කරණය සඳහා බලපෑම් කිරීම යි. මේ සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට නිවුන් සංගණනයකින් ශක්තිමත් ආරම්භයක් සැපයේ. මෙම සංගණනය කරනු ලැබුවේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අනුමැතිය ද සහිතව ය. මෙහි දී ලැබුණු ඔබගේ තොරතුරු අනුව, යථා කාලයේ දී අපි ඔබව හමු වීමට බලාපොරොත්තු වෙමු.

පසුගිය අවුරුදු විස්සක් පමණ කාලයක් තුල ඇති වූ සිවිල් හා ජන වාර්ගික ගැටුම්, සමාජ ආර්ථික හා දේශපාලනික වෙනස්කම් හේතු කොට ගෙන දිවි නසා ගැනීම්, මත්පැන ට ඇබ්බැහි වීම් හා විවිධාකාර මානසික රෝග සුලබ විය. මෙම සුලබ මානසික ආබාධයන් (Common Mental Disorders) ගණයට මානසික ආතතිය හා මානසික අවපීඩනය අයත් වේ. මෙවැනි ආබාධයන් ට ලක් වූවන් ඔබට එදිනෙදා කඩ පිළේ දී, කාර්යාලයේ ද

*අපේ තොරතුරු* **www.infolanka.com/org/twin-registry** *වෙබ් අඩවියෙන්*



ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ නවතම තොරතුරු සමඟ නව මුහුණුවරකින් ඔබ ඉදිරියට එන, අපේ වෙබ් අඩවියට දැන් ඔබටත් පිවිසිය හැකි ය. එය සැකසීමෙන් අපට සහාය දුන් විදුර සමරක්කොඩි මහතාට අපගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමු.




## පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නැති බැරි නිවුන් දරුවන්ට මුදල්

ආර්ථික දුෂ්කරතා සහිත පවුල්වල අලුත උපන් නිවුන් දරුවන් (වයස මාස 06ක් දක්වා) රැක බලා ගැනීමට පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආධාර මුදල් පිරින-මනු ලැබේ. එම ආධාර මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු ලබා ගත හැකි ය.

## ඔබ නිවුන් පුද්ගලයෙක් නම් ඔබේ දරුවන් අනිවාර්යයයෙන් ම නිවුන් දරුවන් වෙනවා ද?

නිවුන් දරුවන් බිහි වීම පරම්පරාගත ව (ජාන මගින්) සිදු විය හැකි සේ ම වෙනත් සාධක මත ද සිදු වීමට හැකි ය. ඒ අතරින් සම (රූපයෙන් එක වගේ) නිවුන් දරුවන් ඇති වීම අහඹු ක්‍රියාවක් ලෙස සලකන අතර එසේ වීමට හේතු සාධක තවමත් සොයා ගෙන නැත. සම නිවුන් දරුවන් ඇති වීම ලෝකයේ බොහෝ ප්‍රදේශවල සමාන අනුපාතිකයකින් සිදු වේ. අසම(එක ගෙදරක සහෝදරයින්/ සහෝදරියන් වගේ) නිවුන් දරුවන් ඇති වීම බොහෝ විට සිදු වන්නේ පරම්පරාගතව (ජානමය සාධක හේතු වීමෙන්) වේ. තව ද දරුවන් ඇති වීමට ලබා ගන්නා ඖෂධ භාවිතයේ දී සහ නළ දරු පිළිසිඳ ගැනීම්වල දී ද අසම නිවුන් දරුවන් ඇති විය හැකි ය. ඔබ නිවුන් පුද්ගලයෙක් වූ පමණින් ඔබේ දරුවන් ද නිවුන් දරුවන් වීමට වැඩි ඉඩකඩක් ලැබෙන්නේ ඔබගේ සම අසමභාවය අනුව ය. ඔබ පරම්පරාගතව බිහි වූ අසම නිවුන් පුද්ගලයෙක් නම් ඔබේ දරුවන් ද නිවුන් දරුවන් වීමට වැඩි හැකියාවක් ඇති අතර ඔබ නිවුන් පුද්ගලයෙක් වූ පමණින් ඔබේ දරුවන් අනිවාර්යයෙන් ම නිවුන් දරුවන් වන්නේ නැත.

### මෙරට පර්යේෂකයන් පුහුණු කිරීමට

## ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් උපදේශකවරයෙක්

එන්ගලන්තයේ, ලන්ඩන් විශ්ව විද්‍යාලයීය, මනෝ වෛද්‍ය ආයතනයේ, මනෝ වෛද්‍ය විශේෂඥ නික් ග්ලොසියර් මහතා ශ්‍රී ලාංකික පර්යේෂකයන් පුහුණු කිරීම සඳහා දිවයිනට පැමිණියේ ය. එම පුහුණු වැඩමුළුව මාර්තු මස 09 වෙනි දින සිට 12 වෙනිදා දක්වා කොළඹ ට්‍රාන්ස් ඒෂියා හෝටලයේ දී පැවැත්විණ. ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් සංවිධානය කරන ලද එම වැඩමුළුවට ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙරට කාර්යාලයේ සහයෝගය ද ලැබුණු අතර එහි උපදේශක වෛද්‍ය පාලිත අබේකෝන් මහතා විසින් වැඩමුළුව විවෘත කරන ලදී.

විශේෂඥ වෛද්‍ය ග්ලොසියර් මහතා විසින් මෙම වැඩමුළුවේ දී, යම් සමාජයක වෙසෙන පුද්ගලයන්ගේ මානසික සෞඛ්‍ය තත්ත්ව හඳුනා ගැනීමට භාවිතා වන, රෝග නිර්ණය කිරීමේ සංයුක්ත ප්‍රශ්නාවලිය (Composite International Diagnostic Interview – CIDI) පිළිබඳ ව මෙරට පර්යේෂකයන් පුහුණු කරන ලදී. ලොව පුරා රටවල් 70 කට වැඩි සංඛ්‍යාවක් සාර්ථක ව භාවිතා කර ඇති එම ප්‍රශ්නාවලිය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සකස් කරන ලද්දකි.



මැද, මනෝ වෛද්‍ය විශේෂඥ නික් ග්ලොසියර් මහතා සහ පුහුණුවට සහභාගී වූවන්

## නිවුන් සංගණනයේ වැදගත්කම

පළමුවැනි පිටුවෙන්

" හෝ නිවසේ දී හමු විය හැකි සාමාන්‍ය පුද්ගලයින් ය. සමහර විට ඔවුන්ගේ එම රෝගී ලක්ෂණ මතු පිටට පෙනීම ට නොහැකි වීමට ද පුළුවන.

ඔබ අතරින් තෝරා ගත් නිවුන් යුගල් 2000 ක් සහ නිවුන් පුද්ගලයන් නොවන අය 1000 ක් පාදක කොට ගෙන එවැනි එදිනෙදා ජීවිතයේ බලපාන මානසික ගැටළු පිළිබඳව කොළඹ දිස්ත්‍රික්කයේ විශාල සමීක්ෂණයක් කිරීමට ද අපි බලාපොරොත්තු වෙමු.

## නිවුන් පුද්ගලයන් පිළිබඳ පර්යේෂණ වල නියැලීම ට කැමති ඔබට

වයස අවුරුදු 18ට වැඩි නිවුන් තරුණ තරුණියන්ගෙන්, පර්යේෂණ සහායකයින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. ඔබේ සුදුසුකම් හැකි ඉක්මණින් අප වෙත ලැබීමට සලස්වන්න.

**ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය**
තැ. පෙ. අංක 04, මුල්ලේරියාව
දුරකථන/ෆැක්ස් : 2578336
විද්‍යුත් තැපැල : sltr@sysnet.lk

## නිවුන් දරු සංගම්



ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයට අනුබද්ධිත ව 2003.11.23 දින පිහිටු වන ලද කෑගල්ල නිවුන් සංගමයේ සාමාජික සාමාජිකාවන් පිරිසක්



## අපේ වාර්තා

### කොළඹ දිස්ත්‍රික්කයෙන්

100 ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුළින් 548

කඩුවෙල/කොලොන්නාව අධ්‍යයනයෙන් 59

නිවුන් සංගණනයෙන් 9360

ප්‍රධාන නිවුන් දත්ත ලේඛනයෙන් 974





**මුළු නිවුන් යුගල් 10,941**

## ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයට නිවුන් පර්යේෂණ පිළිබඳ 11වන ජාත්‍යන්තර සමුළුව සඳහා ඇරයුම්

නිවුන් පර්යේෂණ ක්ෂේත්‍රයේ ලොව ප්‍රමුඛත ම පර්යේෂකයන්ගේ සහභාගීත්වයෙන්, ඩෙන්මාර්කයේ, ඔඩෙන්ස් නගරයේ දී ජූලි මස 2 වැනිදා සිට 4 වෙනිදා දක්වා පවත්වන ලද, නිවුන් පර්යේෂණ පිළිබඳ 11වන ජාත්‍යන්තර සමුළුව ට ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ විධායක කමිටු සාමාජිකයන් සඳහා ද ඇරයුම් ලැබිණි.

වසර 4කට වරක් පැවැත්වෙන මෙම සමුළුව මෙවර සංවිධානය කරනු ලැබුවේ ඩෙන්මාර්ක් නිවුන් ලේඛනාගාරය (Danish Twin Registry) යි. ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ විධායක කමිටු සාමාජික, විශේෂඥ වෛද්‍ය සිසිර සිරිබද්දන ආරාධිත දේශනයක් සඳහා ඇරයුම් ලැබූ අතර, ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් කරන ලද පර්යේෂණ දෙකක තොරතුරු ඉදිරිපත් කිරීමට ද ඇරයුම් ලැබුණි.

සංවර්ධනය වන රටවල විද්‍යාත්මක පර්යේෂණ සංස්කෘතියක් ගොඩ නැගීම සහ ඊට අදාල ආචාරධර්ම පද්ධතියක් සැදීම සඳහා ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් කරගෙන යනු ලබන වැඩ කටයුතු වලට සහයෝගයක් වශයෙන් මෙම අවස්ථාව අප වෙත ලැබුණි. මෙම සමුළුව පිළිබඳ වැඩි විස්තර www.icts2004.sdu.dk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

## අධ්‍යාපනික උපකරණ සඳහා ආධාර


*නැති බැරි පවුල්වල නිවුන් දරුවන්ට අධ්‍යාපනික උපකරණ ලබා ගැනීමට ඇති අපහසුතා දක්වමින් අප වෙත බොහෝ ලිපි ලැබී ඇත.*

*ඔවුන්ගේ එම අවශ්‍යතා ඉටු කර දීම සඳහා දායක වීමට ඔබත් කැමති නම් අප හා එක්වන්න.*

***ඔබට අවශ්‍ය විස්තර සඳහා 011 2419782 න් අප ඇමතිය හැකි ය.***

### *ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ නව ප්‍රකාශන*

## තුන් වෙනි ලෝකයේ පර්යේෂණ පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක්




ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් ප්‍රකාශිත "තුන් වෙනි ලෝකයේ පර්යේෂණ පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක්" ග්‍රන්ථය දොරට වැඩීම පසු ගිය දා ශ්‍රී ලංකා පුස්තකාල ආයතනයේ දී පැවැත්විණි.

මෙම උත්සවය ට මහාචාර්ය ප්‍රියානි සොයිසා, මහාචාර්ය නාරද වර්ණසූරිය, මහාචාර්ය සුසිරිත් මෙන්ඩිස්, මහාචාර්ය හරේන්ද්‍ර ඩි සිල්වා වැනි විද්වතුන් සහභාගි වූහ.

මෙහි ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ එක්සත් රාජධානියේ නොටින්ගෑම් විශ්ව විද්‍යාලයේ මානව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය රොබට් සිම්ප්සන් විසිනි.

## *උසස් පෙළ ව්‍යාපෘති සඳහා තොරතුරු අපෙන්*

රටේ සංවර්ධන ක්‍රියාවලියට දීර්ඝකාලීන සැලසුම් සැකසීමේ දී පාසල් දරුවා වෙත යොමු වීම ද අත්‍යවශ්‍ය කරුණක් වේ. එහි දී පාසල් දරු පරපුර පර්යේෂණ තුළින් අධ්‍යාපනයට යොමු කිරීම සඳහා හඳුන්වා දී ඇති උසස් පෙළ ව්‍යාපෘති ක්‍රමය, ඔවුන්ගේ පර්යේෂණ හැකියාවන් ඔප් නංවමින් වෙනස් ආරයකින් සිතීමට පෙළඹවීම සඳහා මනා පිටුවහලක් වනු ඇත.

මෙම ව්‍යාපෘතීන් සඳහා නිවුන් පුද්ගලයන් පිළිබඳ මාතෘකා ද පාසල් දරු දැරියන් අතර ප්‍රකට ව තෝරා ගැනෙන බව අපට ලැබුණු ලිපි වලින් හෙළි වේ. ඒ අතරින් ව්‍යාපෘතීන් 41 ක් සඳහා ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් දැනට තොරතුරු ලබා දී ඇත.

නිවුන් පුද්ගලයින් පිළිබඳව ව්‍යාපෘති කිරීමට කැමති ඔබට ද, ඒ සඳහා තොරතුරු අප ආයතනයෙන් ලබා ගැනීමට හැකි ය.

**අපට ලැබුණු පාසල් ව්‍යාපෘති වාර්තා ඇසුරින්**

## නිවුන් දරුවන්ගේ අගනුවර

.......කැලිෆෝනියාවේ ලේක්එලිසිනෝර් නගරය කුඩා නගරයක් වුවත් එය නිවුන් දරුවන්ගේ අගනුවර ලෙස ලෝක ප්‍රසිද්ධ ය. මේ නගරයේ ඇති එක් පාසලක් වන රේල්රෝඩ් කැනියන් හි සිටින නිවුන් ජෝඩු අතරින් 6ක් ම සම නිවුන්නු වේ. අනෙක් පාසල වන මස්කනි ලේක්ස් හි සමාන නිවුන් ජෝඩු 4ක් සිටින අතර සිටින මුළු නිවුන් ජෝඩු ගණන 11කි. රේල් රෝඩ් හි ද නිවුන් ජෝඩු 11 ක් සිටිති.

විදුහල් දෙකේ ම ශිෂ්‍ය සංඛ්‍යාව 1200යි. එවැනි සුළු ගණනක් තුළ නිවුන් ජෝඩු 22ක් සිටින එක ම ස්ථානය මෙය යි........

*කේ. වී. මොනාලි මධුමතී ධර්මදාස*
*උසස් පෙළ 2005*
*පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය*

## ලොව වයස්ගතම නිවුන් සොහොයුරියෝ

...........1892 අගෝස්තු 01 දා, ජපානයේ මධ්‍යම නයෝගා හි දී පුංචි පවුලකට දාව ඉපදුනු කින් නරිකා හා ජින් කානියා නම් වූ නිවුන් සොහොයුරියෝ, 2000 වසර වන තෙක් ලොව වයස්ගත ම නිවුන් සොහොයුරියෝ විය. 1992 වසරේ ජපන් ජාතිකයන් විසින් මෙම සොහොයුරියන් දෙදෙනා "ජාතික සම්පත" යන ගෞරව නමින් හඳුන්වනු ලැබීය........

*අනුෂ්කා නිරෝෂනී පෙරේරා*
*මිලාගිරිය ශාන්ත පාවුළු විද්‍යාලය*

ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය දැන් වෘත්තීයවේදිකයන්ගේ සංවිධානයක් ලෙස නීත්‍යානුකූල ව ලියාපදිංචි වී ඇත.

ජ්‍යෙෂ්ඨ නීතීඥ ජයන්ත දොලවත්ත

මේ පිළිබඳ ව අපට දුන් සහයෝගය පිළිබඳව කෘතඥ වෙමු.

## බද්ධ නිවුන්නු පළමුවැනි පිටුවෙන් ...

කලලය දින දොළහක් ඉක්මවීමෙන් පසු බෙදී යාම හේතුවෙනි. එම බෙදී යාම සම්පූර්ණයෙන් ම සිදු නො වන නිසා වැඩෙන දරුවන් දෙදෙනා එකිනෙකාට බද්ධ වී මෙළොව එළිය දකිනු ලබයි. ඔවුන් වෙන් කිරීම තීරණය කරනු ලබන්නේ දෙදෙනාගේ ශරීර අභ්‍යන්තරයේ අවයව හා රුධිර වාහිනීවල පිහිටීම අනුව ය.

මෙවැනි බද්ධ නිවුන්නුන් (conjoined twins) සියම් නිවුන්නුන් (siamese twins) ලෙසට ද හඳුන්වනු ලැබේ. 1811 දී සියම් දේශයේ දී (වර්තමාන තායිලන්තය) උපත ලැබූ, පසුව බටහිර රටවල්වල සංචාරය කර ප්‍රසිද්ධියට පත් චැං සහ එං නම් වූ බද්ධ නිවුන් සහෝදරයන් දෙදෙනා නමින් මොවුන් එලෙස හඳුන්වා ඇත. මොවුන් දෙදෙනා විසින් තම අසාමාන්‍ය වූ බද්ධ ස්වරූපය ප්‍රදර්ශනය කරමින් විශාල මුදලක් උපයා ගනු ලැබිණ.

## කායික ස්වරූපය බොහෝ දුරට සමාන වුව ද ඇඟිලි සලකුණු වලින් වෙනස් වෙන සම නිවුන්නු

සම නිවුන් පුද්ගලයන් ඇති වන්නේ මවගේ එක් ඩිම්බයක් පියාගේ එක් ශුක්‍රාණුවක් සමඟ සංසේචනය වීමෙන් පසු ඇති වන යුක්තාණුව බෙදීමෙනි. මෙසේ ඇති වන නිවුන් පුද්ගලයින්ගේ කායික ස්වභාවය පිළිබඳව ලොව පුරා කර ඇති පර්යේෂණ වලින් හෙළි වී ඇත්තේ ඔවුන්ගේ ජාන (පරම්පරාවෙන් පරම්පරාවට ලක්ෂණ උරුම කරවන දේහ කොටස්) සෑම අතින් ම සමාන බැවින් කායික ස්වරූපයන් බොහෝ දුරට සමාන බව යි.

එනමුත් මොවුන්ගේ ඇඟිලි සලකුණු එකිනෙකාගෙන් වෙනස් වෙන බවට ද එම පර්යේෂණ වල දී හෙළි වී ඇත. එබැවින් අනෙක් පුද්ගලයන්ගේ මෙන් ම, සම නිවුන් පුද්ගලයන්ගේ ද වෙන් වෙන් වශයෙන් අනන්‍යතාවය සොයා බැලීමට ඇඟිලි සලකුණු යොදා ගත හැකි වේ.

## අපේ පිංතූර එකතුවෙන්

ඔබගේ ඡායාරූපය ද අපට ලැබීමට සලස්වන්න. තෝරා ගත් ඡායාරූප ඉදිරි නිවුන් පුවත් පත් වල පළ කෙරෙනු ඇත.



1 TW 5363
සවිඳු අවිෂ්ක රාජසූරිය, සචිනි අමායා රාජ--සූරිය, සචිත් කේසර රාජසූරිය, පිළියන්දලින්



2 TW 5074 -
හෂාන් දිනේෂ් සහ හසිත දිනේෂ්, නුවරින්



3 TW 5688 -
විනයා පින්සරි සහ විහඳ දසන්පිත්, කොට්ටාවෙන්



4 TW 5768
සසංක අවිශ්ක කුමාර සහ සසංක ප්‍රවිශ්ක කුමාර, අම්බලන්ගොඩින්



5 TW 5557
ගයනි ලසන්තිකා සහ ගීතානි ලසන්තිකා, ගොඩකවෙලින්

## ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ ලියාපදිංචි වීමට කැමති ඔබ සඳහා

### ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය - අයදුම්පත

නම ස්ත්‍රී/පුරුෂ
(1) ............................................................ (1) ..............................
(2) ............................................................ (2) ............................
නිවුන් පුද්ගලයන්ගේ ලිපිනය (1) ..........................................................................................
(2) ..........................................................................................
දුරකථන අංක (1) ..........................................................................................
(2) ..........................................................................................
පදිංචි ප්‍රා. ලේ.කොට්ඨාශය (1) ...................................... (2) ....................
පදිංචි දිස්ත්‍රික්කය (1) ...................................... (2) .....................
උපන් දිනය ........................................... වයස ..............................
අත්සන (1) ........................................... (2) ..............................
නිවුන් යුගල වයස 18 ට අඩු නම් මව හෝ පියාගේ අත්සන .......................................
තොරතුරු සපයන අයගේ නම සහ ලිපිනය ......................................................................
..........................................................................................
උප්පැන්න සහතිකය අමුනා නොමැති නම් තොරතුරු සත්‍ය බවට සහතික කරන අයගේ නම සහ ලිපිනය . ......................................................................

**නිවුන් පුවත්**

වෙත

.........................................................................
.........................................................................
.........................................................................
.........................................................................
.........................................................................

ආපසු

**ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය**
තැ. පෙ. අංක 04
මුල්ලේරියාව.

නිවුන් පුද්ගලයන් අතර බෙදා හැරීම පිණිස ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් ......................... දරණ ස්ථානයේ ........................... දී මුද්‍රණය කරවන ලදී.